අවසාන වාර පරීක්ෂණය - www.eduLanka.lk - 111 විෂයය කාණ්ඩය
11 ශ්‍රේණිය කාලය පැය 2 යි
සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - 1 කොටස

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. "ඔබ කියන දේ මට නොවැටහේ" මෙය සන්නිවේදනයේදී හඳුන්වන්නේ
   I. මාධ්‍ය බාධක II. අර්ථ බාධක III. සන්නිවේදන ස්වරූප IV. සන්නිවේදන නිර්වචනයකි
2. වාචික සන්නිවිදනයේ නිපුණතාවක් නොවන්නේ
   I. ඉදිරිපත් කිරීමේ කුසලතා සංවර්ධනය III. කථන රටා පුහුණු වීම
   II. වාං මාලාව පුළුල් කර ගැනීම IV. උචිත ආකෘතියක් හා සැලැස්මක් තිබීම
3. වෙළඳපොල ආර්ථිකය තුළ වැදගත්වන උපකරණයක් ලෙස හැඳින්විය හැකිය
   I. ගණක යන්ත්‍රය II. දින මුද්‍රා යන්ත්‍රය III. මුදල් සටහන් යන්ත්‍රය IV. තැපැල් මුද්‍රා යන්ත්‍රය
4. විද්‍යුත් තැපෑලෙහි දක්නට ලැබෙන විශේෂ වාසියක් වන්නේ
   I. තත්පර කිහිපයක් තුළ ලොව ඕනෑම තැනකට පණිවිඩ යැවිය හැකි බව III. අතිශයින් ජනප්‍රිය භාවයට පත් වීම
   IV. විශාල පිරිසකට එකවර පණිවිඩයක් ලබා දීම
   II. වත්කම් ආරක්ෂා කිරීමට විධිවිධාන සැළසීම
5. "මනෝහාරී" වැඩ සටහන මීට කළකට ඉහතදී ජාතික රූපවාහිනියෙහි අතිශයින් ජනප්‍රිය භාවයට පත් වූ සංගීතමය වැඩසටහනකි. මෙමගින් ජනමාධ්‍යයේ,
   I. ආගමික හා සදාචාරාත්මක නියෝජනයක් සිදුවේ. III. ස්ත්‍රී - පුරුෂ සමාජ භාවය පිළිබඳ නිදසුන් සපයයි.
   II. ආර්ථික නියෝජනයක් සිදුවේ. IV. සෞන්දර්යාත්මක නියෝජනයක් සිදුවේ.
6. පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය වන්නේ කුමක්දැයි ගුවන් විදුලි මාධ්‍යයට විශේෂිතව,
   A. අනෙක් සියළුම ජනමාධ්‍ය වලට වඩා වේගයෙන් තොරතුරු සපයයි.
   B. අනෙක් සියළු ජනමාධ්‍යයන්ට සාපේක්ෂව ලාභදායී හා භාවිතයට පහසුය
   C. ග්‍රාහකයාට වෙනත් කාර්යයක නියැලෙමින් වුවද භාවිත කළ හැකිය
   I. A සත්‍යය III. A හා C සත්‍යය
   II. B හා C සත්‍යය IV. A, B හා C යන සියල්ල සත්‍යය
7. නිෂ්චල ඡායාරූප
   A. ත්‍රිමාණ ලෝකය ද්විමාන තලයක සටහන් කර ගනී.
   B. සාමාන්‍ය ජීවිතයේදී සිහිවටන වශයෙන් සටහන් කර ගනී.
   C. මුද්‍රිත මාධ්‍යයේදී තොරතුරු වල විශ්වාසනීයත්වය, විස්තරාත්මක බව හා ආකර්ශනීය බව ලබා දෙයි.
   ඉහත ප්‍රකාශ අතුරින්,
   I. A පමණක් සත්‍යය III. C පමණක් සත්‍යය
   II. A හා B පමණක් සත්‍යය IV. A, B හා C යන සියල්ල සත්‍යය
8. සමීක්ෂණයක් සඳහා ප්‍රශ්නාවලියක් සකස් කිරීමේදී අනුගමනය කළ යුතු සාමාන්‍ය පිළිවෙත වන්නේ,
   I. වැඩි තොරතුරු ප්‍රමාණයක් ලබා ගැනීමට උපරිම ප්‍රශ්න ගණනක් ඇතුළත් කිරීම.
   II. විස්තරාත්මකව පිළිතුරු ලබා ගත හැකි ප්‍රශ්න ප්‍රමාණයක් ඇතුලත් කිරීම.
   III. ප්‍රතිචාර ඉතා කෙටියෙන් හා සරලව ලබා ගත හැකි ප්‍රශ්නාවලිය සකස් කිරීමයි.
   IV. ප්‍රතිචාර ඉතා ගැඹුරින් ලබා ගත හැකි අයුරින් ප්‍රශ්නාවලිය සකස් කිරීමයි.
9. යම් සිනමා පටයක් හෝ රූපවාහිනී වැඩසටහනක් හෝ උසස් රූපාවලියකින් යුක්ත යැයි නිගමනය කරන්නේ
   I. අවශ්‍ය භාෂාව මැනවින් යොදාගෙන ඇති නිසාය III. ඓතිහාසික හා දේශපාලන තොරතුරු ගැබ් වන නිසාය
   IV. විනෝදාත්මක අන්තර්ගතයකින් යුක්ත වන නිසාය
   II. රූප පෙළ සදාචාරාත්මක නිසාය
10. "ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය හා සන්නිවේදන ක්‍රියාවලිය සම්බන්ධව දැකිය හැකි ප්‍රධාන ගැටළුවක් වන්නේ සප්‍රමාණික වූ ද සප්‍රාණවත් වූද සන්නිවේදන විචාරයක් බිහි වී නොතිබීමයි." ඉහත සඳහන් ආකාරයේ වාක්‍ය රටා වඩාත් යෝග්‍ය වන මාධ්‍ය වන්නේ
    I. ගුවන් විදුලියයි. III. පුවත්පතයි.
    II. රූපවාහිනියයි. IV. සිනමාවයි.
11. රජවාසල මිදුලේ වනා තිබූ සීනි පැදුර දුටු අන්දරේට සීනි කෑමට සිත්විය. ඔහු තම පුතුට කථා කොට, ගෙදර ගොස් පැමිණ "මව මිය ගිය බව" තමාට දන්වන ලෙස කීවේය. මෙහි දක්නට ලැබෙන්නේ
    I. පුද්ගලාන්තර හා සමූහ සන්නිවේදනයයි.

II. අන්තර්වර්ති හා පුද්ගලාන්තර සන්නිවේදනයයි.
III. සමූහ සන්නිවේදනය හා ජන සන්නිවේදනයයි.
IV. අන්තර්වර්ති හා සමූහ සන්නිවේදනයයි.

12. රූපවාහිනී මාධ්‍යය තුළ ප්‍රකාශ වන ප්‍රධාන සන්නිවේදන රටාව නම්,
I. විවරණ හා කථන ක්‍රමයයි.
II. ලේඛන හා රූපණ ක්‍රමයයි.
III. රූපන හා කථන ක්‍රමයයි.
IV. ලේඛන හා විවරණ ක්‍රමයයි.

13. ප්‍රවෘත්ති සංස්කරණයේදී සිදුවීමට අවම ඉඩක් ඇත්තේ,
I. වාර්තා කරන ලද තොරතුරු කොටසක් පමණක් තෝරා ගැනීමය.
II. වාර්තාවේ තොරතුරුවලින් සැලකිය යුතු ප්‍රමාණයක් ඉවත් කිරීම.
III. වාර්තාවේ කරුණු වෙනස් කිරීමය.
IV. භාෂාව වෙනස් කිරීමය.

14. ගුවන් විදුලි මාධ්‍යය සතු ඉතා විශිෂ්ට ගුණයක් නම් ග්‍රාහකයාට,
I. උසස් සංගීත රසයක් ලබා දීමයි.
II. ඉහළ විනෝදාස්වාදයක් ලබා දීමයි.
III. පරිකල්පනය සඳහා අවකාශ ලබා දීමයි.
IV. සාක්ෂරතාවක් අවශ්‍ය වීමයි.

15. ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියෙකුටම සිය අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ඇත. එම අයිතිය නම්,
I. මානව හිමිකම් නම් වේ.
II. සදාචාරාත්මක අයිතියකි.
III. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පිළිගෙන ඇත.
IV. දණ්ඩ නීති සංග්‍රහය මගින් ආරක්ෂා කරයි.

16. ගුවන් විදුලි මාධ්‍යයේ තාක්ෂණික ක්‍රියාවලියෙහි නිරත වන පුද්ගලයෙකු වශයෙන් හැඳින්වේ.
I. කාර්මික නිලධාරියා.
II. නිෂ්පාදකයා.
III. නිවේදකයා.
IV. අධ්‍යක්ෂකවරයා.

17. ළමා මනස හා ජනමාධ්‍ය පිළිබඳ හැදෑරීමේදී ඒ පිළිබඳව වැදගත් අර්ථ කථනයක් ඉදිරිපත් කළ විද්‍යාඥයෙකි.
I. කාල් මාක්ස්
II. ජීන් පියාජේ
III. ඇරිස්ටෝටල්
IV. ගුටෙන්බර්ග්

18. නිහඬ සිනමා යුගයේ සිටි දැවැන්ත ශිල්පියෙකු ලෙස හැඳින්වේ.
I. සුන්දරලිංගම්
II. චාලි චැප්ලින්
III. සර්ජි අයිසන්ටයින්
IV. ජෝශප් නිප්සේ

19. පොතක පිට කවරය ආකර්ෂණීය වීම පොත මිලදී ගැනීමට බලපාන ප්‍රධාන සාධකයක් නොවන්නේ මින් කුමන ගණයේ පොත්ද?
I. නවකතා පොත්
II. රහස් පරීක්ෂක පොත්
III. ශාස්ත්‍රීය පොත්
IV. ළමා පොත්

20. තමා සතු සමාජීය වටිනාකම තේරුම් ගෙන මාධ්‍ය පරිහරණය පාලනය කර ගැනීම,
I. විචාරශීලී ග්‍රාහකත්වය නම් වේ.
II. ස්වයං වාරණය නම් වේ.
III. ප්‍රතිපෝෂණය නම් වේ.
IV. නිරවද්‍ය වාර්තාකරණය නම් වේ.

(ලකුණු 2x20 = 40)

අවසාන වාර පරීක්ෂණය - 2010 - 111 විෂයය කාණ්ඩය
11 ශ්‍රේණිය කාලය පැය 2 යි
සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - 11 කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.

1. පාසල් මාධ්‍ය දිනය නිමිත්තෙන් උත්සවයක් පැවැත්වීමට අදාලව මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්වීමට ඔබට පැවරී තිබේ.
   I. උත්සවය සංවිධානය කිරීමේදී ඔබ අනුගමනය කරන ප්‍රධාන ක්‍රමවේද 5ක් ලියන්න.
   II. මාධ්‍ය සාකච්ඡාව සඳහා යොදාගනු ලබන මාධ්‍ය තාක්ෂණික උපකරණයක් නම් කරන්න.
   III. මාධ්‍ය උත්සවය සඳහා සිසුන් දැනුවත් කිරීමට ඔබ භාවිත කරන ක්‍රම 3ක් ලියන්න.
   IV. මාධ්‍ය සාකච්ඡාවේ තොරතුරු සුරක්ෂිතව තබා ගන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.
   V. ඔබ සංවිධානය කරන උත්සවයට අදාලව පුවත්පත් වාර්තාවක් (වචන 50 කට පමණ සීමා වූ) ලියා උචිත ශීර්ෂ පාඨයක්ද ලියන්න.
   VI. මාධ්‍ය සාකච්ඡාවේදී ඔබ හා පිරිස සම්බන්ධ වන සන්නිවේදන වර්ගය කුමක්දැයි සඳහන් කොට එම සන්නිවේදන ක්‍රමයේ දක්නට ලැබෙන වාසි 5ක් ලියන්න.
   VII. පාසලේ මාධ්‍ය උත්සවය පිළිබඳව හැකිතාක් ඉක්මනින් ඔබට ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට මාද්‍ය සම්බන්ධීකරණය සම්බන්ධව දැනුවත් කළ යුතුව ඇත. ඒ සඳහා ඔබ අනුගමනය කරන ක්‍රමවේදය කුමක්ද?
   VIII. පාසල් මාධ්‍ය දින උත්සවයේ දී ඔබ බලාපොරොත්තු වන වැඩසටහන් අංග 5ක් ලියා දක්වන්න.
   IX. ජනමාධ්‍ය දිනක් පාසලකට අවශ්‍ය වන්නේ මන්දැයි පැහැදිලි කරන්න.
   X. පාසල් මාධ්‍ය දිනය සම්බන්ධ රූපවාහිනී වැඩ සටහනක දක්නට ලැබේ නම් එය කවර වැඩසටහන් වර්ගයට අයත්දැයි දක්වන්න.

2. අමල් හා කමල් එකම පන්තියේ ඉගෙනුම ලබන මිතුරන් දෙදෙනෙකි. ඔවුන්ගේ විනෝදාංශ ලෙෂ අමල් රූපවාහිනියටත්, කමල් සිනමාවටත් ඇලුම් කරයි නම්,
   I. මෙහි සඳහන් මාධ්‍ය දෙකෙහි සමාන අසමානතා ලැයිස්තුවක් සකස් කරන්න.
   II. සිනමාව සඳහා අයිස්ටයින්ගේ සමෝධාන සිද්ධාන්තයෙන් අදහස් කරන්නේ කුමක්ද?
   III. ශ්‍රී ලංකාවේ රූපවාහිනී සංගීත වැඩ සටහන් වල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ 2ක් සුහන් කරන්න.
   IV. "කථානාද සිනමාවට වඩා නිහඬ සිනමාව ප්‍රබලය." මේ පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.

3. ප්‍රවෘත්ති වාර්තාකරණය යනු අතිශය සංකීර්ණ ක්‍රියාවලියකි.
   I. ප්‍රවෘත්ති වාර්තාකරුවෙකු ෂතු විය යුතු ගුණාංග 5ක් දක්වන්න.
   II. ඔහු විසින් සම්පාදිත ප්‍රවෘත්තියේ තිබෙන ලක්ෂණ 5ක් ලියන්න.
   III. ඉහළ ස්ථාවර භාවයකින් යුත් ප්‍රවෘත්ති මූලාශ්‍ර ලබා ගත හැකි ආකාර 10ක් සඳහන් කරන්න.
   IV. අන්තර්ජාතික වශයෙන් ජනමාධ්‍ය වෙත තොරතුරු ලැබෙන ප්‍රධාන විධික්‍රමය කුමක්ද? එවැනි ස්ථාන 3ක් සඳහන් කරන්න.

4. ඔබ ප්‍රදේශයේ අර්තාපල් අල ගොවීන්ගේ ගැටළුවක් පිළිබඳව ගොවීහු උද්ඝෝෂණ ව්‍යාපාරයක් පැවැත්වූහ. මෙය වාර්තා කිරීම සඳහා විවිධ ජනමාධ්‍යකරුවෝ ඉදිරිපත් වූහ.
   I. ගොවීන් උද්ඝෝෂණයේදී භාවිත කරන ලද සන්නිවේදන ස්වරූප 4ක් සඳහන් කරන්න.
   II. අදාල බලධාරීන් වෙත තම ගැටළු ඉදිරිපත් කිරීමට ඔමුන් යොදා ගත යුතු විධිමත් ක්‍රමයක් සඳහන් කරන්න.
   III. ඵලදායී ලෙස ගැටළුව විසඳන බබවට බලධාරීන් ජනතාවට ප්‍රකාශ කිරීමට යොදාගනු ලබන ක්‍රමවේදයක් නම් කරන්න.
   IV. මෙම උද්ඝෝෂණය සඳහා බලධාරීන් දක්වන ප්‍රතිචාර කුමන නමකින් හැඳින්වේද?

5. සමාජ අසමානතාවයේ ප්‍රතිඵලයක් ලෙෂ සමාජ පන්ති ගොඩනැගේ. එය සංවර්ධනයට ප්‍රබලව බලපායි.
   I. සමාජ සංවර්ධන කාර්යයට බලපෑම් කරන පංති විවිධත්වය සමාජ විද්‍යාඥයින් දකින ආකාරය රූපසටහනක් මගින් පෙන්වන්න.
   II. බහු ආගමික පදනම ජනමාධ්‍යයෙන් ළඟා විය යුතු බව අධ්‍යයනය කළ යුතු ක්‍රමවේදය කුමක්ද?
   III. සෞන්දර්යාත්මක ප්‍රබෝධයකින් යුතු වැඩසටහනකින් ග්‍රාහකයාට සැලසෙන වාසි 2ක් සඳහන් කරන්න.
   IV. ජනමාධ්‍යයේ වෙළඳපොල අර්ථකථනය වන්නේ කෙසේද?

6.

I. සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන ඩෙංගු රෝගය පිළිබඳව ජනමාධ්‍යයෙන් ජනතාව දැනුවත් කළ හැකි රූපවාහිනී වැඩසටහන් කෙසේ සකස් විය යුතු දැයි විමසන්න.

II. වෘත්තීය ජායාරූප ශිල්පියෙකුට අවශ්‍ය වන උපකරණ ලැයිස්තුවක් සකස් කරන්න.

III. ක්ෂණික ජායාරූප යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද?

IV. එහි ඇති විශේෂතා කවරේද?

1 ප්‍රශ්නයට ලකුණු - 20
සෙසු ප්‍රශ්න සඳහා ලකුණු 10 බැගින්

www.eduLanka.LK